Department of Education,Sabaragamuwa Province/ Weekly School

<u>ක්‍රීඩා නීති රීති හා ආචාරධර්ම වලට අනුගත වෙමින් සමාජානුයෝගීව කටයුතු කරයි.</u>

- තරගාවලි

යම් ක්‍රීඩාවකදී කණ්ඩායම් අතර හෝ පුද්ගලයන් අතර හෝ සම්මත නීති මාලාවකට අනුකූලව ජයග්‍රාහකයන් තෝරා ගැනීමට පවත්වනු ලබන තරග මාලාව තරගාවලියක් ලෙස හැඳින්වේ.
තරගාවලියක තරග සටහන සැකසීමේදී "සාධාරණ තරගය" යන සංකල්පයට හානි නොවිය යුතුය.
තරග සටහන් සකසන ක්‍රම කිහිපයක් තිබේ

❖ <u>පැරදි පිළිමලුන් පිටුදැකීමේ ක්‍රමය</u>(ඉවතලෑමේ ක්‍රමය)

මෙම ක්‍රමයේ කොටස් දෙකකි
1.කණ්ඩායම් ගණන දෙකේ බලයක් වූ විට
2.කණ්ඩායම් ගණන දෙකේ බලයක් නොවූ විට

1- <u>කණ්ඩායම් ගණන දෙකේ බලයක් වූ විට</u>-2 ($2^1$ ),4 ($2^2$)…..

උදා- A හා B ද,C හා D ද තරග වැදී ජයග්‍රහණය කළ කණ්ඩායම් අවසාන තරගයට සම්බන්ධ වේ.

n-1 යෙදීමෙන් තරග සංඛ්‍යාව ගණනය කළ හැකිය.("n" යනු කණ්ඩායම් ගණනයි)

1)කණ්ඩායම් ගණන 8ක් හා 32 ක් වන ඉවතලෑමේ ක්‍රමයේ තරග සටහන් අඳින්න, n-1 යොදා තරග ගණන සොයන්න.
2)ඉවතලෑමේ ක්‍රමයේ වාසි හා අවාසි ලැයිස්තුගත කරන්න.